**ශීර්ෂය 320 - සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව**

---------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 15 දින ගණන්දීමේ නිලධාරීයා වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරිමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශිලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමන් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.
- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූපි වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශයන් ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

## 1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) දෙපාර්තමේන්තුව සතු වාහනවලින් සමාලෝචිත වර්ෂය අවසන් වනවිට වාහන 163 ක් තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි. | සියලුම වාහන තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී අනෙකුත් වාහන තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දක්වා තිබුණි. |
| (ආ) පරිගණක උපකරණ, විද්‍යුත් උපකරණ හා සන්නිවේදන උපකරණ යන වත්කම් වෙන් වෙන්ව හඳුනා නොගෙන කාර්යාල උපකරණ ලෙසට ගිණුම් ගත කර තිබුණි. | වත්කම් නිවැරදිව වර්ගීකරණය කර වාර්තා කළ යුතුවේ. | වෙන් වෙන් වශයෙන් වාර්තා කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව දක්වා තිබුණි. |
| (ඇ) ආයතනයේ ගිණුම් වාර්තා කිරීමේ පදනම යටතේ බලකා ව්‍යාපෘති තුල පවත්වා ගෙන යනු ලබන දිගු කාලීන භෝග වගාවන්හි වටිනාකම්, මූල්‍ය ප්‍රකාශන තුල වාර්තා කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශ තුල අදාල වටිනාකම් නිවැරදිව වාර්තා කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉඩම්වල අයිතිය දෙපාර්තමේන්තුව සතු නොවන බැවින් වැඩිදුර උපදෙස් ලබා ගෙන ඉදිරියේදී පොත්වලට ඇතුලත් කිරීමට කටයුතු කරන බව දක්වා තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 2019 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු සකස් කිරිමේ දී නිසි පරිදි පුරෝකථනය සිදු නොකිරීම හේතුවෙන් අවස්ථා 03 ක දී මුදල් රෙගුලාසි 66 මගින් වැය විෂයයන් 07 ක් සඳහා එකතුව රු.මිලියන 21.50 ක ප්‍රතිපාදන මාරුකර තිබුණි. | ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පිළියෙල කළ යුතුවේ. | ලැබී තිබුණු ප්‍රතිපාදන මු.රෙ.66 යටතේ මාරු කර ගැනීම මගින් ප්‍රතිපාදන අවශ්‍යතාවයන් සපුරාගෙන තිබුණු බව දක්වා තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වැය විෂයයන් 04 ක ප්‍රතිපාදනවලින් සියයට 11.6 සිට සියයට 65.8 දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරිවීම් පැවතිණි. | ඇස්තමේන්තු පුරෝකථනයන් සහ වියදම් කළමනාකරණය හැකිතාක් නිවැරදිව සිදු කළ යුතුවේ. | අදාල ඉතිරිවීම් සඳහා ප්‍රමාණවත් අක්මුදල් නොලැබීම හේතු වූ බව දක්වා තිබුණි. |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 වර්ෂය සඳහා වැය විෂයයන් 4 කට අදාලව රු.මිලියන 1.83 ක් වූ බැරකම් වටිනාකමින් 2020 මැයි 31 දින වන විට කිසිදු මුදලක් පියවා නොතිබුනු අතර, වැය විෂයයන් 7ක් සම්බන්ධයෙන් බැරකම් වටිනාකමින් සියයට 50 කට වඩා අඩුවෙන් පියවා තිබුණි. | පෙර වර්ෂයන්ට අදාළ බැරකම් නොපමාව නිරවුල් කළ යුතුවේ. | ගෙවීම් සඳහා බිල්පත් ඉදිරිපත් නොවූ බැවින් ගෙවීම් සිදු කර නොමැති බව දක්වා තිබුණි. |

## 2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉටුකිරිමට සැලසුම් කර තිබුණු විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති කාර්යයන් අතුරින් 2019 දෙසැම්බර් 31 දිනට “ග්‍රාමීය වැව්වල ජලජ ශාක ඉවත් කිරීම” අම්පාර දිස්ත්‍රික් වැඩ සටහන, විදුලි වැට ඉදිකිරිම හා නඩත්තු අධීක්ෂණ කටයුතු සඳහා ඉන්ධන සලාකය, “ රට වෙනුවෙන් එකට සිටිමු” මොණරාගල දිස්ත්‍රික් වැඩසටහන, මුලතිව් දිස්ත්‍රික් වැඩසටහන හා සුවසිරිපාය භූමි අලංකරණය කිරීම් වැඩසටහන යන කාර්යයන්ගේ ප්‍රගතිය පිළිවෙලින් සියයට 3.5 , සියයට 77 , සියයට 67, සියයට 61 ක් හා සියයට 58 ක් විය. | මූල්‍ය කාර්යය සාධනය හා භෞතික කාර්යය සාධනය ඒකාකාරී මට්ටමක පවත්වා ගෙන යාම කළ යුතුවේ. | ගෙවීම් කටයුතු කිරීම සඳහා ප්‍රමාණවත් අක්මුදල් ප්‍රමාණයක් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් ලබා නොදීම හේතුවූ බව දක්වා තිබුණි. |

**2.4 අත්තිකාරම් ගිණුම් ශේෂ**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව 2019 දෙසැම්බර් 31 දිනට සේවය හැරගිය නිලධාරීන් 430 ක ගෙන් රු.මිලියන 13.77 ක වටිනාකමක අයවීම් හිඟ හිට තිබුණි. ඉන් රු.මිලියන 5.29 ක මුදලක් වර්ෂ 1 ත් - 2 ත් අතර කාල පරාසයක සිට පැවත එමින් තිබුණ අතර හිඟ හිටි ණය අයකර ගැනීම දුර්වල මට්ටමක පැවතුණි. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv වැනි පරිච්ඡේදයේ 4 වන ඡේදයේ නියමයන් පරිදි ක්‍රියා කළ යුතුවේ. | හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව දක්වා තිබුණි. |

**3 මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලසුම් කිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මෝල්පේ ප්‍රදේශයේ ඉදිකරනු ලැබූ දෙපාර්තමේන්තු මූලස්ථාන ගොඩනැගිල්ලේ මූලික සැලැස්ම සඳහා මෙතෙක් නාගරික සංවර්ධන අධිකාරියෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි. | අදාල අනුමැතීන් ලබා ගනිමින් ඉදිකිරීම් කටයුතු කළ යුතුවේ. | නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබා ගැනීම සඳහා කටයුතු කරමින් ඇති බව දක්වා තිබුණි. |

**3.2 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සතු භෞතික සම්පත්, මානව සම්පත් සහ අභ්‍යන්තර අරමුදල් උපයෝගී කර ගනිමින් බලකායන් 22 ක් සහ පුහුණු පාසල් 05 ක් මගින් විවිධ ස්වරූපයේ ව්‍යාපෘති ආරම්භ කර පවත්වාගෙන යන | දෙපාර්තමේන්තුව තම දැක්ම, මෙහෙවර හා කාර්යයන් වර්තමාන අවශ්‍යතාවයන් හා ක්‍රියාකාරකම්වලට අනුව හඳුනා ගැනීමට කටයුතු කළ යුතුවේ. | රටේ පැවති යුධමය වාතාවරණය අවසන් වීමෙන් පසු දෙපාර්තමේන්තුවේ භට/භටවරියන් ඵලදායි කටයුතුවලට යොදා ගැනීමේ අපේක්ෂාවෙන් ආරක්ෂක අමාත්‍යාංශය සහ |

| | | |
|---|---|---|
| නමුත් දෙපාර්තමේන්තුව තම දැක්ම,මෙහෙවර හා කාර්යයන් යටතේ එවැනි ව්‍යාපෘති පවත්වා ගෙන යාමක් හඳුනාගෙන නොතිබුණි. | | භාණ්ඩාගාරයේ එකඟතාවය ඇතිව බලකා සහ පුහුණු පාසල් වල කෘෂි,පශු හා විවිධ ව්‍යාපෘති ආරම්භ කළ බව දක්වා තිබුණි. |

## 3.3 ප්‍රසම්පාදනයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 වර්ෂයේදී අවශ්‍යතාවය ඉක්මවා වැඩිපුර කොළ කැමා තොප්පි 2,577 ක්,ක්‍රීඩා සපත්තු ජෝඩු 5,111 ක්, කොට්ට උර 36,104 ක් , ඇඳ ඇතිරිලි 36,104 ක්, සහ මදුරු දැල් 604 ක් මිලදී ගැනීම වෙනුවෙන් පිළිවෙලින් රු.මිලියන 0.75 ක්, රු.මිලියන 15.77 ක්, රු.මිලියන 9.96 ක්, රු.මිලියන 849.82 ක් හා රු.මිලියන 1.36 ක් වැඩිපුර වැය කර තිබුණි. | අවශ්‍යතාවයන් නිවැරදිව හඳුනාගෙන සකසුරුවන් අයුරින් හා කාර්යක්ෂම ලෙස වියදම් දැරීමට කටයුතු කළ යුතුවේ. | විශේෂ අවස්ථාවලදී භාවිතා කිරීමට අමතර ප්‍රමාණයක් තබා ගැනීම අවශ්‍ය බව දක්වා තිබුණි. |

## 3.4 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2016 මාර්තු 31 දිනැති 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.2.2 අනුව සෑම මුදල් වර්ෂයකම මාර්තු 15 දිනට පෙර පසුගිය වර්ෂය සඳහා වන භාණ්ඩ සමීක්ෂණ කටයුතු භෞතිකව අවසන් කල යුතු වුවත්, 2019 මූල්‍ය වර්ෂය සඳහා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් පත්කර තිබුණු සමීක්ෂණ මණ්ඩල 34ක් අතුරින් 2020 අප්‍රේල් 30 දින වනවිට සමීක්ෂණ මණ්ඩල 31ක් පමණක් සිය කටයුතු සම්පූර්ණ කර තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව සෑම මුදල් වර්ෂයකම මාර්තු 15 දිනට පෙර පසුගිය වර්ෂය සඳහා වන භාණ්ඩ සමීක්ෂණ කටයුතු භෞතිකව අවසන් කල යුතු වේ. | රටේ පැවති අයහපත් තත්වය මත භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කිරීමට නොහැකි වූ බවද 2020 ජූලි 31 දිනට පෙර අවසන් කළ හැකි බව දන්වා තිබුණි. |

3.5 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මහඔය බලකායේ ගඩොල් නිෂ්පාදන ව්‍යාපෘතියේ ගඩොල් 782,326 ක ඌනතාවයක් නිසා සිදුවී තිබුණු අලාභය වගකිව යුතු නිලධාරීන්ගෙන් පියවා ගැනීමට විමර්ශන මණ්ඩලය විසින් 2018 ජූලි 03 වන දින නිර්දේශ කර තිබුණු නමුත් අලාභය අයකර ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. | අලාභහානි අය කර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී අය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව දක්වා ඇත. |

4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ, තෘතියික, ද්විතියික හා ප්‍රාථමික මට්ටම්වල පුරප්පාඩු පිළිවෙලින් 05 ක්,39 ක් ,48 ක් හා 4,265 ක් විය. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 16,002.55 ක් වැය කර තිබුණු අතර ඒ අනුව වාර්ෂික ඒක පුද්ගල වියදම රු. මිලියන 0.44 ක් වී තිබුණි. | කාලීනව ගැලපෙන පරිදි අනුමත කාර්යය මණ්ඩලය සංශෝධනය කරවා ගැනීම හෝ කාර්යය මණ්ඩලය සුදුසු පරිදි බඳවා ගැනීමට ක්‍රියා කළ යුතුවේ. | අදහස් දැක්වීම් කර නොතිබුණි. |